# පුරප්පාඩු
## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් 2025.10.22 දින සිට 2025.11.06 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. <u>ඖෂධවේදී (පහළ ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

(i) සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගත් යෝග්‍යතා සහතිකය ලබා තිබීම.

වැටුප් පරිමාණය :- රු. **51,095-7x540; 10x640- 60,575 (මාසික) U-MT 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මගින්.

වයස :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**2. <u>විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

(i) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහායක කාර්යයට අදාල තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් N.V.Q 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

(ii) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කාර්මික කුසලතා සහිත සේවා පළපුරුද්ද

**වෙනත්:**

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
(iii) මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :- රු. **44,575 - 16x490 - 60,575 (මාසික) U-PL 2(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**3. <u>රියදුරු (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයක් (06) අවමය සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව උපරිම වාර දෙකක දී සමත් වී තිබීම.

සහ

(ii) බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය ලබාගෙන තිබිය යුතු අතර රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීමේ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබීම.

**වෙනත්:**

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
(iii) මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 48,005 - 16x490 - 55,845 (මාසික) U-PL 3(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**සටහන :** අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 15%කට සමාන මුදලක් එම අරමුදලට දායක වන අතර එම 15%න් 7%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට හා 8%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3%ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

අයදුම්පත් මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online Portal) 2025.10.22 දින සිට 2025.11.06 දින දක්වා විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර https://www.sjp.ac.lk/vacancies වෙබ් පිටුව මගින් ලබා ගත හැකි අතර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://hrms.sjp.ac.lk/vacancies/nonacademic/open වෙත පිවිසිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයක / රාජ්‍ය දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරන අයදුම්කරුවන් අයදුම් කරන ලද තනතුරට තේරී පත්වුවහොත් තමා සේවය කරන ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවට වූ තම ආයතනයේ ප්‍රධානී සහතිකය අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ උඩුගත (Upload) කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් උඩුගත (Upload) කර නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

යම් තනතුරක් සඳහා අයදුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබුණු අවස්ථාවක අවස්ථාවෝචිත ක්‍රමයක් අනුගමනය කරමින් අයදුම්කරුවන් සීමා කිරීමක් සිදු වේ.

කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

**ලේඛකාධිකාරී,**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
2025.10.21